WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | |
|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** |
| சங்கீதம் (கீழைத்தேய) | **I, II** |
| Music (Oriental) | **I, II** |

## සංගීතය (පෙරදිග) II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) ස ධ︤ ප ධ︤, ම ප, ග︤ ම ග︤ රි︤ ස මෙම ස්වර සංගතිය අයත් වන හින්දුස්ථානි රාගය නම් කරන්න.

(ii) නිර්දේශිත තාල අතුරෙන් 'ඛලි'ස්ථානය අටවන මාත්‍රාවෙහි යෙදෙන හින්දුස්තානි තාලය නම් කරන්න.

(iii) ස්වර සප්තකයක ඇතුළත් සියලු ම ප්‍රකෘති හා විකෘති ස්වරයන්ගේ එකතුව කීයද?

(iv) "සුහැ සරණිය මිණි පැමිණිය කොත් අගට" මෙම ගී පාදය ගායනයට සුදුසු වරිත කුමක් ද?

- අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.
  - ලෙංචිනා මගේ නංගියේ ඇයි ගං තෙරට වී ගොම්මනේ
  - දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි
  - මෝරා බීජයෙනා - කළපත් දෙකඩත් කරසිත් තුටුවෙත්
  - 'බලන් අපි උන්නේ - එහෙත් එනකං නේ'
  - ශාක්‍ය මුනි සිරිපා නිති වඳිමි

(v) උඩරට වන්නමකට අයත් ගී පාදය තෝරා ලියන්න.

(vi) කෝලම් ගීත ආශ්‍රිතව නිර්මාණය වී ඇති සරල ගී පාදය තෝරන්න.

(vii) නාට්‍ය දෙබස් ගීතවත් ව ඉදිරිපත් කිරීමට යොදා ගත් "බොලන් පොඩි නංගි ටිකක් හිටපන්කො" යන රබන් පදයේ ගති ලක්ෂණය ඇතුළත් ගී පාදය තෝරා ලියන්න.

(viii) සී. ද. එස්. කුලතිලක සූරීන් විසින් ජන සංගීතය ඇසුරෙන් නිර්මාණය කරන ලද ගී පාදය තෝරා ලියන්න.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) පාසල් තූර්ය වාදන කණ්ඩායම් සඳහා යොදා ගැනෙන, සුෂිර වාද්‍ය ගණයට අයත් ස්වර පුවරු සංගීත භාණ්ඩ දෙකක් වන්නේ ........................ සහ ........................ ය.

(x) මහනුවර යුගයේ දී කවිකාර මඩුව කේන්ද්‍ර කොට ගෙන ප්‍රශස්ති, ........................ සහ ........................ යන ගීත ප්‍රබන්ධ නිර්මාණය වී ඇත.

(ලකුණු 02 × 02 = 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** පහත වගුවෙහි දැක්වෙන විස්තර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රාගය | රාග විස්තරය |
|---|---|
| A | • සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන මෙම රාගයේ මධ්‍යම හා නිෂාද යන ස්වර වර්ජ්‍ය වේ. |
| B | • ස්වර දෙකක් පමණක් කෝමල වන මෙම නිර්දේශිත රාගයේ ජාතිය සම්පූර්ණ වේ. |

(i) ඉහත සඳහන් රාග විස්තර අනුව A සහ B ට ගැළපෙන රාග **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) එම රාග දෙකෙන් **එක් රාගයක්** තෝරාගෙන ඊට අයත්,

- මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටසේ ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

**නැතහොත්**

- මධ්‍යලය වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා අටකට නො අඩු තානාලංකාර **දෙකක්** තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

(iii) ඉහත (ii) කොටසේදී ඔබ **තෝරා නොගත්** රාගයට අයත්,

- ආරෝහණ, අවරෝහණ
- රාග සංගතියක් හා වාදී ස්වරය ලියා දක්වන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**3.** නිර්දේශිත රාග ඇසුරෙන් නිර්මාණය වූ ස්වර ප්‍රස්තාර දෙකක් A සහ B වශයෙන් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| A | ග ම රි | ග ප – | ධ නි ස̇ | රි̇ ස̇ නි |
| | ධ ප ම | ග ම රි | ස – රි | ස – – |

| | | | | |
|---|---|---|---|---|
| B | ග රි | නි̣ – රි | ග – | ප – රි (⌒) |
| | ග රි | නි̣ – ධ̣ | නි̣ – | රි ස – |

(i) ඉහත A සහ B ස්වර ප්‍රස්තාර කොටස් අයත් වන නිර්දේශිත රාග **දෙක** අදාළ ඉංග්‍රීසි අක්ෂර සමග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) A සහ B ස්වර ප්‍රස්තාර දෙකට අදාළ හින්දුස්තානි තාල **දෙක** පිළිවෙළින් නම් කර, ඉන් **එක්** තාලයකට අයත් ඨේකාව නියමිත මාත්‍රා, විභාග සහ තාල සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

(iii) A සහ B ස්වර ප්‍රස්තාර කොටස් අයත් රාග දෙකෙන් **එක් රාගයක්** තෝරාගෙන ඊට අයත් 'සර්ගම්' ප්‍රබන්ධයක් ස්ථායි, අන්තරා වශයෙන් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**4.** (i) "සේ ගී" යටතට අයත් වන ගී වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගැල් ගී, කෙළි ගී යන ගී වර්ග දෙකෙහි සුවිශේෂ ලක්ෂණ **දෙක** බැගින් වෙන් වෙන් ව ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) නිර්දේශිත බැති ගීතයක පාද **දෙකක්** පමණක් ගීත ස්වර ප්‍රස්තාර කර, ඊට අදාළ තිත ද නම් කරන්න. (ලකුණු 05 යි)

**(මුළු ලකුණු 12 යි)**

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

5. (i) නූර්ති සංගීතය පිළිබඳ ව අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (අ) ආභාසය ලත් සංගීත සම්ප්‍රදාය නම් කරන්න.
   (ආ) ප්‍රධාන සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න.
   (ඉ) භාරතීය සංගීතඥයෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) පහත සඳහන් පාරිභාෂික වචන අතුරෙන් තෝරාගත් **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.
   (අ) උරුට්ටුව (ආ) දොහොරාව (ඉ) තෝඩායම
   (ඊ) ඉන්නිසය (උ) පොතේගුරු (ලකුණු 04 යි)

(iii) කෝලම් හා සොකරි රංග ශෛලීන්ට ආවේණික සංගීතමය ලක්ෂණ **දෙක** බැගින් වෙන් වෙන් ව ලියා දක්වන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

6. පහතින් දක්වා ඇත්තේ ප්‍රචලිත සරල ගීතයක අතුරු වාදන කොටසකට අයත් අපරදිග ප්‍රස්තාරයකි.





(i) ඉහත සංගීත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

(ii) එම ප්‍රස්තාරයේ පළමු විභාග හතර මධ්‍යමභාවයට පෙරළා පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. **(එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 4 ට ලකුණු 02 යි)**

(iii) පහත A, B, C සහ D යන ඉංග්‍රීසි අක්ෂරයන්ගෙන් දැක්වෙන අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත නම් කරන්න.



A B C D

(ලකුණු 04 යි)
**(මුළු ලකුණු 12 යි)**

WWW.OLEVELAPI.COM

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) හින්දුස්තානි සංගීතයෙහි දස මේල (ථාට) අතරින් කැමති මේල (ථාට) **හතරක්** නම් කර, ඒ ඒ මේලයට (ථාටයට) අදාළ ආරෝහණ ස්වර ලියන්න.

(ii) පතල් ගී සහ බඹර ගී පිළිබඳ සමානතා **දෙකක්** හා අසමානතා **දෙකක්** ලියා දක්වන්න.

(iii) රේඛාව චිත්‍රපටයෙන් පසු මෙරට තිරගත වූ චිත්‍රපටයකට අයත් ගීතයක් නම්කර, එම ගීතය අයත් චිත්‍රපටය, එහි සංගීත නිර්මාතෘ සහ ගායක/ගායිකාවන් වෙන් වෙන් ව ලියා දක්වන්න.

(iv) පරිගණක සංගීතය සඳහා යොදාගැනෙන මෘදුකාංග **හතරක්** නම් කරන්න.

(v) තබ්ලාවක දළ රූපසටහනක් ඇඳ, එහි කොටස් **හතරක්** නම් කරන්න. **(ලකුණු 04 × 3 = 12 යි)**

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....